# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1932/65 - 2015 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

දකුණු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

දකුණු පළාතේ, පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් සඳහා තේරී පත්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මවිසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස වාහලතන්ත්‍රිගේ සිසිර කුමාර මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, වාහලතන්ත්‍රිගේ සිසිර කුමාර මහතා එම පුරප්පාඩුව සිදු වූ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 සැප්තැම්බර් මස 17 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

10-243

1A - G 22350 – 26 (2015/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*